SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2020 විෂය නිර්දේශය

**නියාමක ප්‍රශ්න පත්‍රය**

## අදියර I

# 101 - මූල්‍ය ගිණුම්කරණය [FAC]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
## 101 - මූල්‍ය ගිණුම්කරණය (FAC)
## නියාමක ප්‍රශ්න පත්‍රය

**අයදුම්කරුවන්ට උපදෙස් (කරුණාකර අවධානයෙන් කියවන්න) :**

**දෙනු ලබන කාලයඃ**

- ලිවීම සඳහා පැය 03 යි.

**ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහයඃ-**

- A කොටස, B කොටස සහ C කොටස ලෙස කොටස් 3 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විතය.
- සියළුම ප්‍රශ්නවලට උත්තර ලිවිය යුතුයග

**ලකුණුඃ**

- එක් එක් කොටස සඳහා ලකුණු :

| කොටස | ලකුණු |
|---|---|
| A | 40 |
| B | 40 |
| C | 20 |
| **එකතුව** | **100** |

- එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු පෙන්වා ඇත. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා සමත්වීමේ ලකුණු 50% කි.

**උත්තරඃ**

- සියළුම උත්තර,සපයනු ලබන උත්තර පොත්වල ලිවිය යුතුය. ප්‍රශ්නපත්‍රවල ලියනු ලබන උත්තර ලකුණු දීම් සඳහා ඇගයීමට ලක් නොකරනු ඇත.
- එක් එක් ප්‍රශ්නය සඳහා ඔබේ උත්තරය අළුත් පිටුවකින් ආරම්භ කරන්න.
- සියලුම පෙර වැඩ පැහැදිලිව පෙන්නුම් කළ යුතුය.
- තීරුවල උත්තර නොලිවිය යුතුය.

**උත්තර පොත්ඃ**

- එක් එක් උත්තර පොතේ මුල් පිටුවේ උපදෙස් පෙන්වා ඇත.

**ගණකයන්ත්‍රඃ**

- සංකේත වීජගණිතමය හා අවකලනය සඳහා පහසුකම් සලසා ඇති ඒවා හැර ඕනෑම ගණක යන්ත්‍රයක් අයදුම්කරුවන්ට භාවිත කිරීමට අවකාශය ඇත. වැඩසටහන් කළ හැකි ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

**ඇමුණුම්ඃ-**

- කළයුතු ක්‍රියා පරීක්‍ෂා ලැයිස්තුව. එක් එක් ප්‍රශ්නය (වාස්තවික පරීක්‍ෂා ප්‍රශ්න හැර) කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ දී ඇති නිර්වචනය මත පදනම්ව අයදුම්කරුවන් විසින් උත්තර සැපයිය යුතුය.

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**
**අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.**

**A කොටස**

(එකකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

**අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය, ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.**

(1.1) පහත සඳහන් ඒවා අතුරෙන්, මූල්‍ය ගිණුම්කරණයේ මූලික අරමුණ වන්නේ කුමක්ද?

(1) සේවක ප්‍රසාද දීමනා ගෙවීමට.
(2) පරිශීලකයන්ට තීරණ ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය තොරතුරු සැපයීමට.
(3) වෙළඳපළ තරඟකාරීත්වය හඳුනා ගැනීමට.
(4) ව්‍යාපාරයේ දේපළ ආරක්ෂා කර ගැනීමට.

(1.2) ගිණුම්කරණයට **කෘතීම බුද්ධිය** මගින් ඇතිවන බලපෑම හඳුන්වනු ලබන්නේ,

(1) තාක්ෂණික වෙනස්කම් ලෙසයි. (2) සාමාජීය වෙනස්කම් ලෙසයි.
(3) ආර්ථික වෙනස්කම් ලෙසයි. (4) දේශපාලනික වෙනස්කම් ලෙසයි.

(1.3) ප්‍රනාන්දු මහතා ඔහුගේ පෞද්ගලික ගණුදෙනු, ඔහුගේ ව්‍යාපාරයේ ගණුදෙනුවලින් වෙන්කොට පවත්වා ගනී. ඔහුගේ මෙම භාවිතයට අදාල ගිණුම්කරණ සංකල්පය වන්නේ,

(1) සංගතතා සංකල්පයයි. (2) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි.
(3) අස්තිත්ත්ව සංකල්පයයි. (4) ද්විත්ව රූප සංකල්පයයි.

(1.4) වත්කමක් සම්බන්ධයෙන් **අසත්‍ය** ප්‍රකාශනය වන්නේ,

(1) වත්කමක් මගින් ව්‍යාපාරයක මූල්‍ය තත්ත්වය පෙන්නුම් කෙරේ
(2) වත්කමක් යනු අතීත සිදුවීමක ප්‍රතිඵලයකි
(3) වත්කමක් ආර්ථික ප්‍රතිලාභ අඩු කිරීමට හේතු වේ
(4) අස්තිත්ත්වය විසින් වත්කමක පාලනය සිදු කරනු ලබයි

(1.5)

| වත්කම් | = | ස්කන්ධය | + | වගකීම් |
|---|---|---|---|---|
| (50,000) | | (75,000 ) | | 25,000 |

ඉහත සඳහන් ගනුදෙනු අතුරෙන් ගිණුම්කරණ සමීකරණය වඩා හොඳින් විස්තර කරනු ලබන්නේ කුමන ගණුදෙනුවද?

(1) රු. 75,000 ක් වූ විදුලි බිලෙන් රු. 50,000 ක් ගෙවීම.
(2) රු. 50,000 ක් වූ විදුලි බිල සඳහා රු. 75,000 ක් ගෙවීම.
(3) රු. 75,000 ක් වූ විදුලි බිලෙන් රු. 25,000 ක් ගෙවීම.
(4) කාලපරිච්ඡේදයට අදාල වියදමක් ලෙස රු. 50,000 ක් ගෙවීම.

(1.6) ව්‍යාපාරයක ගනුදෙනු හා සිදුවීම් වාර්තාකිරීමේ දී නෛතික රාමුවට වඩා ගිණුම්කරණ යථාර්ථය මත පිහිට කටයුතු කරයි. මෙය හඳුන්වනු ලබන්නේ,

(1) හෙළිදරව්කිරීමේ සංකල්පය ලෙසයි.

(2) ස්වරූපයට වඩා යථා තත්ත්වය වැදගත් බවේ සංකල්පය ලෙසයි.

(3) උපචිත සංකල්පය ලෙසයි.

(4) මූල්‍ය මිනුම් සංකල්පය ලෙසයි.

(1.7) පහත සඳහන් ගනුදෙනු අතරින් ව්‍යාපාරයේ වත්කම් සඳහා පමණක් බලපානු ලබන ගනුදෙනුව වන්නේ කුමක්ද?

(1) මෝටර් රථයක් රු. 890,000 ක් වූ අත්පිට මුදලට මිලට ගැනීම.

(2) මාසික දුරකථන බිල ලෙස රු. 98,000 ක් ගෙවීම.

(3) ණයහිමියන්ට රු. 125,000 ක් ගෙවීම.

(4) ව්‍යාපාරයේ අයිතිකරු විසින් රු. 85,000 ක් ඔහුගේ පෞද්ගලික පරිහරණයට ගැනීම.

(1.8) 2019 මාර්තු 31 දිනට කේවලස්වාමී ව්‍යාපාරයක් වූ **මධුර ට්‍රේඩර්ස් හි** පොත්වලින් පහත ශේෂයන් උපුටා ගෙන ඇත.

| | රු. |
|---|---|
| ජංගම නොවන වත්කම් | 1,500,000 |
| ජංගම නොවන වගකීම් | 250,000 |
| ජංගම වත්කම් | 300,000 |
| ජංගම වගකීම් | 210,000 |
| වර්ෂය සඳහා ලාභය | 525,000 |
| වර්ෂය තුළදී ගැනිලි | 300,000 |

2018 අප්‍රේල් 01 දිනට ව්‍යාපාරයේ ප්‍රාග්ධනය වූයේ,

(1) රු. 1,340,000 (2) රු. 1,115,000 (3) රු. 1,800,000 (4) රු. 1,565,000

(1.9) මූල්‍ය වාර්තාකරණය පිළිබඳ වූ සංකල්පමය අකෘතිමය රාමුවට අනුව මූල්‍ය තොරතුරුවල ගුණාත්මක ලක්ෂණයක් වන්නේ කුමක්ද?

(1) උපචිත පදනම. (2) ප්‍රමාණාත්මකභාවය.

(3) අඛණ්ඩ පැවැත්ම. (4) අදාලබව.

(1.10) පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයන්ගෙන් අඩු අගයට තොග ආගණනය කිරීම අයත් වන්නේ පහත සංකල්ප අතරින් කුමකටද?

(1) සංගතතා. (2) අඛණ්ඩ පැවැත්ම.

(3) විචක්ෂණ බව. (4) අස්තිත්ත්ව.

**පහත සඳහන් එක් එක් ප්‍රකාශයන් සත්‍ය හෝ අසත්‍ය යන්න සඳහන් කරන්න. සත්‍ය හෝ අසත්‍ය යන්න ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.**

(1.11) බැංකු ණයක් ලබා ගැනීම, ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් යන දෙකටම බලපෑමක් සිදු කරයි.

(1.12) ACCPAC යනු විශේෂිත වූ ගිණුම්කරණ මෘදුකාංගයක් සඳහා උදාහරණයකි.

(1.13) ශේෂ පිරික්සුමක හර හා බැර ශේෂයන්ගේ එකතුව සමාන වීම ගණිතමය නිරවද්‍යතාවට තහවුරුවක් වුවද එහි තවදුරටත් වැරදි පැවතිය හැකිය.

(1.14) ඓතිහාසික පිරිවැය සංකල්පයට අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම්වල වටිනාකම එහි වර්තමාන වෙළඳපළ අගයට පෙන්නුම් කෙරේ.

(1.15) මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනයට වන බලපෑම මත පදනම්ව මූල්‍ය ගිණුම්කරණයේ මූලිකාංග වර්ගීකරණය කිරීමට පුළුවනි.

**අංක 1.16 සිට 1.20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි උත්තර, ප්‍රශ්න අංකය සමග උත්තර පොතේ ලියන්න.**

(1.16) අස්තිත්වයක් හස්තමය ගිණුම්කරණ පද්ධතියේ සිට පරිගණකගත ගිණුම්කරණ පද්ධතියට යොමුවීමට හේතුවන කරුණු දෙකක් (02) ලැයිස්තුගත කරන්න.

(1.17) කේවල ස්වාමී ව්‍යාපාරයක් වන ABC **ට්‍රේඩර්ස්** හි පහත සඳහන් එක් එක් ගනුදෙනු වාර්තා කිරීමට භාවිත කරන මූලාශ්‍ර ලියවිල්ල සඳහන් කරන්න.

**(a)** ණය පදනම මත පාරිභෝගිකයකුට අලෙවි කල රු. 250,000 ක් වටිනා භාණ්ඩ, තත්ත්වයෙන් බාල වීම නිසා ඔහු විසින් හරවා එවන ලදි.

**(b)** භාණ්ඩ බෙදා හැරීමේ කටයුතු සඳහා රු. මිලියන 2 ක් වටිනා මොටර් රථයක් ණය පදනම මත මිලට ගැනීම.

(1.18) වගකීමක් යන්න නිර්වචනය කරන්න.

(1.19) ව්‍යාපාර ආයතනයක් විසින් බැංකු සැසඳුම් ප්‍රකාශනයක් පිළියෙල කිරීමේ ප්‍රධාන අරමුණ සඳහන් කරන්න.

(1.20) **සචිනි ට්‍රේඩර්ස්** හි 2019 දෙසැම්බර් මාසයට අදාල ගිණුම් පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි.

| | රු. |
|---|---|
| 2019 දෙසැම්බර් 01 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය | 989,600 |
| මාසයට අදාල විකුණුම් ජ'ර්නලයේ එකතුව | 1,569,700 |
| මාසයට අදාල ගැණුම් ජ'ර්නලයේ එකතුව | 885,200 |
| මාසය තුලදී ලද වට්ටම් | 25,600 |
| මාසය තුලදී ලියා හරින ලද අඩමාන ණය | 30,000 |
| මාසය තුලදී ගණුදෙනුකරුවන්ගෙන් ලද ලැබීම් | 1,200,000 |
| මාසයට අදාල ආපසු එවුම් ජ'ර්නලයේ එකතුව | 32,500 |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2019 දෙසැම්බර් 31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය ගණනය කරන්න.

*(එකකට ලකුණු 02 බැගින්)*
*(මුළු ලකුණු 40)*

**A කොටසෙහි අවසානය**

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

**B කොටස**

## 02 වන ප්‍රශ්නය

**KPM ට්‍රේඩර්ස්** දේශීය වෙළඳපළ තුල කාර්යාල ගෘහභාණ්ඩ අලෙවියේ නියුතු ආයතනයකි. **KPM ට්‍රේඩර්ස්** හි 2019 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම එකඟ නොවූ අතර ශේෂ පිරික්සුමේ වෙනස අවිනිශ්චිත ගිණුමට බැර කොට කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදි. කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය රු. 1,725,000 කි.
පහත දැක්වෙන වැරදි පසුව හඳුනා ගන්නා ලදි.

(1) නැවත විකිණීමේ අරමුණෙන් මිලට ගත් රු. 81,000 ක් වටිනා කාර්යාල ගෘහභාණ්ඩ ස්ථාවර වත්කම් ලෙස ඇති ගෘහභාණ්ඩ ගිණුම තුල වාර්තා කර ඇත.

(2) විකුණුම් ජ'ර්නලයේ එකතුව රු. 75,000 කින් අඩුවෙන් සටහන් වී ඇත.

(3) බැංකු ගිණුමට, සෘජුවම ලද රු. 79,000 ක් වූ පොළී ආදායම මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇති නමුත් පොළී ආදායම් ගිණුමේ සටහන්ව ඇත්තේ රු. 7,900 ක් ලෙසය.

(4) රු. 48,000 ක් වූ දුරකථන වියදම, මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇති නමුත් දුරකථන වියදම් ගිණුමට දෙවරක් හර කර ඇත.

(5) 2018 ඔක්තෝබර් 01 දින රු. 190,000 කට මිලට ගත් මෝටර් බයිසිකලය මුදල් පොතේ නිවැරදිව සටහන් කර ඇති අතර එය මෝටර් රථ ගිණුමේ සටහන්ව ඇත්තේ රු. 109,000ක් ලෙසය. ආයතනය එහි මෝටර් රථ සරල මාර්ග ක්‍රමය යටතේ වර්ෂයකට 12% බැගින් ක්ෂය කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ :**

(a) ඉහත දෝෂ නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ජ'ර්නල් සටහන් **පිළියෙල කරන්න**. *(ලකුණු 06)*

(b) ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය **හඳුනා දක්වන්න.** *(ලකුණු 02)*

(c) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගලපන ලද ශුද්ධ ලාභය **ගණනය කරන්න.** *(ලකුණු 02)*

*(මුළු ලකුණු 10)*

## 03 වන ප්‍රශ්නය

**කරුණාතිලක මහතා** 2018 අප්‍රේල් 01 දින රු. 1,250,000 ක මුදලක් බැංකු ගිණුමක ආයෝජනය කර සිල්ලර භාණ්ඩ අලෙවිසැලක් ආරම්භ කරන ලදි. 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකු ප්‍රකාශනයේ විශ්ලේෂණය පහත පරිදි වේ.

| | **තැන්පතු (රු.)** | | **ගෙවීම් (රු.)** |
|---|---|---|---|
| ආරම්භක ආයෝජනය | 1,250,000 | සුළු මුදල් ප්‍රතිපූරණය කිරීම | 30,000 |
| ණයගැතියන්ගෙන් ලද මුදල් | 975,000 | ජල බිල්පත් | 28,000 |
| අත්පිට විකුණුම් | 1,300,000 | කාර්යාලීය උපකරණ (2018.04.01 දින මිලට ගන්නා ලද) | 240,000 |
| | | විදුලිය | 163,000 |
| | | වැටුප් හා වේතන | 1,540,000 |
| | | ණයහිමියන්ට කළ ගෙවීම් | 1,290,000 |
| | | බැංකු ගාස්තු | 13,500 |
| | **3,525,000** | | **3,304,500** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) 2019 මාර්තු 31 දිනට ණයගැති, ණයහිමි සහ උපචිත වියදම්වල ශේෂයන් පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| වෙළඳ ණයගැතියන් | 671,000 |
| වෙළඳ ණයහිමියන් | 320,000 |
| ගෙවිය යුතු ජල බිල්පත | 5,500 |

(2) දෛනික විකුණුම්වලින් ලද මුදල් බැංකු ගත කිරීමට පෙර පහත සඳහන් ගෙවීම් සිදු කර ඇත.

| | රු. |
|---|---|
| දුරකථන වියදම් | 42,000 |
| ගැනිලි | 75,000 |
| ප්‍රචාරණය | 25,000 |

(3) කාර්යාල උපකරණ පිරිවැය මත වාර්ෂිකව 25% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

(4) ආයතනයේ සුළු මුදල් ගණුදෙනු පහත පරිදි වේ.

**සුළු මුදල් පාලන ගිණුම**

| | රු. | | රු. |
|---|---|---|---|
| ප්‍රධාන මුදල් පොතෙන් ලැබීම් | 30,000 | ලිපි ද්‍රව්‍ය | 7,200 |
| | | ගමන් වියදම් | 9,800 |
| | | ප. ගෙ. ශේෂය | 13,000 |
| | 30,000 | | 30,000 |

(5) සියළුම මිලට ගැනීම් ණය පදනම මත වන අතර 2019 මාර්තු 31 දිනට තොග කිසිවක් නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ :**

2019 මාර්තු 31 දිනට **කරුණාතිලක මහතාගේ** අලෙවිසැලේ ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න**. *(ලකුණු 10)*

## 04 වන ප්‍රශ්නය

පහත සඳහන් තොරතුරු ප්ලාස්ටික් පෙට්ටි නිෂ්පාදනය කරනු ලබන **ජනසෙත සහ පුත්‍රයෝ** හි 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල වේ.

| | රු. |
|---|---|
| 2019 ජනවාරි 01 වන දිනට තොගය | |
| අමු ද්‍රව්‍ය | 1,700,000 |
| නොනිමි වැඩ (ප්‍රථමික පිරිවැයට අගය කළ) | 960,000 |
| අමු ද්‍රව්‍ය මිලට ගැනුම් | 2,100,000 |
| ගෙන ඒමේ කුලී - අමු ද්‍රව්‍ය | 228,000 |
| කම්හල් යන්ත්‍ර නඩත්තු වියදම් | 426,000 |
| ගොඩනැගිලි - පිරිවැයට | 892,000 |
| යන්ත්‍ර - පිරිවැයට | 1,280,000 |
| වැටුප - නිෂ්පාදන කළමණාකරු | 928,000 |
| විදුලිය | 632,000 |
| කම්හල් අරක්‍ෂක වියදම් | 115,000 |
| සෘජු වේතන | 1,123,000 |
| ජලය | 522,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

(1) 2019 දෙසැම්බර් 31 දිනට අවසන් තොග පහත පරිදි ආගණනය කර ඇත.

| | |
|---|---|
| අමු ද්‍රව්‍ය | රු. 1,900,000 |
| නොනිමි වැඩ (ප්‍රථමික පිරිවැයට අගය කළ) | රු. 1,356,000 |

(2) ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණයෙන් 70% ක් කම්හල සඳහා භාවිත කරයි.

(3) ගිණුම්වල වාර්තා කර ඇති සියළුම යන්ත්‍ර නිෂ්පාදන කටයුතු සඳහා සම්පූර්ණයෙන්ම භාවිත කරයි.

(4) පහත වියදම් දී ඇති අනුපාතයන්ට අනුව බෙදා වෙන් කල යුතුය.

| **වියදම්** | **කම්හල** | **කාර්යාල** |
|---|---|---|
| විදුලිය | 90% | 10% |
| ජලය | 80% | 20% |

(5) ගොඩනැගිලි සහ යන්ත්‍ර පිළිවෙලින් පිරිවැය මත 10% සහ 20% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්‍ෂය කරනු ලබයි.

(6) එක් නිෂ්පාදිත පෙට්ටියක් සඳහා රු. 5 ක දිරි දීමනාවක් ලැබීමට කම්හල් සේවකයන් හිමිකම් කියනු ලබන අතර වර්ෂය තුලදී පෙට්ටි 20,000 ක් නිෂ්පාදනය කර ඇත.

(7) සියළුම නිෂ්පාදිත භාණ්ඩ පිරිවැය මත 15% ක ලාභාන්තිකයක් සහිතව අලෙවිය සඳහා වෙළෙඳ අංශයට මාරු කරනු ලබන අතර, සියළුම නිෂ්පාදනය කළ අයිතම, වෙළෙඳ අංශයට මාරු කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ :**

(a) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **ජනසෙත සහ පුත්‍රයෝ** හි නිෂ්පාදන ගිණුම **පිළියෙල කරන්න**. *(ලකුණු 08)*

(b) එක් පෙට්ටියක නිෂ්පාදන පිරිවැය **ගණනය කරන්න**. *(ලකුණු 02)*

*(මුළු ලකුණු 10)*

## 05 වන ප්‍රශ්නය

(A) **පෙරේරා මහතාට** අයත් ව්‍යාපාරයේ 2019 ඔක්තෝබර් 31 දිනට මුදල් පොතේ බැර ශේෂය රු. 45,000 ක් වූ අතර එදිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය වෙනස් අගයක් විය. වෙනසට අදාල හේතුන් පහත පරිදි වේ.

(1) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්වල වටිනාකම රු. 50,000 කි.

(2) නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල චෙක්පත්වල වටිනාකම රු. 25,000 කි.

(3) බැංකු ගිණුමට සෘජුවම ලද රු. 3,500 ක පොළී ආදායම මුදල් පොතේ සටහන් කර නොමැත.

(4) ස්ථාවර නියෝග යටතේ බැංකුව විසින් ගෙවන ලද රක්ෂණ දායකය වන රු. 4,800 ක් සහ බැංකුව විසින් මාසය සඳහා අය කරන ලද බැංකු ගාස්තුව වූ රු. 4,500 ක් මුදල් පොතේ සටහන් කර නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ :**

(a) 2019 ඔක්තෝබර් 31 දිනට ගලපන ලද මුදල් පොත **පිළියෙල කරන්න**. *(ලකුණු 03)*

(b) 2019 ඔක්තෝබර් 31 දිනට බැංකු ප්‍රකාශනයේ සඳහන් ශේෂය **හඳුනා දක්වන්න**. *(ලකුණු 02)*

(B) **සිල්වා ට්‍රේඩර්ස්** හි ඇතැම් ගණුදෙනුවලින් ගිණුම්කරණ සමීකරණයට සිදු වූ බලපෑම පහත පරිදි වේ.

| | ජංගම නොවන වත්කම් | + තොග | + වෙළඳ ලැබිය යුතු මුදල් | + මුදල් | = | ස්කන්ධය | + වගකීම් |
|---|---|---|---|---|---|---|---|
| (1) | | | | + 500,000 | = | + 500,000 | |
| (2) | | + 450,000 | | | = | | + 450,000 |
| (3) | | - 400,000 | + 425,000 | + 75,000 | = | = 100,000 | |
| (4) | | | | - 20,000 | = | | - 20,000 |
| (5) | +200,000 | | | - 50,000 | = | | + 150,000 |
| (6) | | - 50,000 | | | = | = - 50,000 | |

**ඔබ විසින් කළ යුතු දෑ :**

ඉහත 2 සිට 6 දක්වා වියහැකි ගණුදෙනු **හඳුනා දක්වන්න**.

(උදාහරණ 1 - රු. 50,000 ක මුදලක් ව්‍යාපාරයේ ආයෝජනය කිරීම) *(ලකුණු 05)*

*(මුළු ලකුණු 10)*

**B කොටසෙහි අවසානය**

**අනිවාර්ය ප්‍රශ්න එක (01) කි.**

(මුළු ලකුණු 20)

**C කොටස**

## 06 වන ප්‍රශ්නය

**ගයාන් වීරසිංහ මහතාට** අයත් **ගයාන් ට්‍රේඩර්ස්,** විද්‍යුත් උපකරණ අලෙවියේ යෙදී සිටින කේවලස්වාමී ව්‍යාපාරයකි. **ගයාන් ට්‍රේඩර්ස්** හි 2019 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

**ගයාන් ට්‍රේඩර්ස්**

**2019 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** (රු.'000)

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| පිරියත සහ උපකරණ - පිරිවැයට | | |
| මෝටර් ලොරි රථය | 1,900 | |
| කාර්යාල උපකරණ | 540 | |
| ගෘහභාණ්ඩ (2018 සැප්තැම්බර් 30 දින මිලට ගන්නා ලද) | 1,840 | |
| 2018 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය | | |
| මෝටර් ලොරි රථය | | 340 |
| කාර්යාල උපකරණ | | 160 |
| විකුණුම් | | 17,390 |
| මිලට ගැනුම් | 12,200 | |
| 2018 අප්‍රේල් 01 දිනට තොග | 875 | |
| ගෙවන ලද කුලිය | 650 | |
| වැටුප් හා වේතන | 990 | |
| විදුලිය | 525 | |
| ජලය | 110 | |
| වෙළඳ ලැබිය යුතු මුදල් | 1,250 | |
| වෙළඳ ගෙවිය යුතු මුදල් | | 1,100 |
| වෙළඳ කාර්ය මණ්ඩලයට ගෙවූ කොමිස් මුදල් | 320 | |
| 2018 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | | 2,985 |
| ගැනිලි | 415 | |
| 2018 අප්‍රේල් 01 දිනට වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා වෙන් කිරීම් | | 80 |
| බැංකු ශේෂය | 90 | |
| ස්ථාවර තැන්පතු | 350 | |
| | 22,055 | 22,055 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2019 මාර්තු 31 දිනට පැවති අවසන් තොගයේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය පිළිවෙලින් රු. 1,625,000 සහ රු. 1,600,000 ක් විය.

(2) ව්‍යාපාරයේ ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය වනුයේ පහත දැක්වෙන පරිදි සරල මාර්ග ක්‍රමය භාවිත කරමින් පිරිවැය මත ක්ෂය කිරීමයි.

මොටර් ලොරි රථය - 15%
කාර්යාල උපකරණ - 20%
ගෘහභාණ්ඩ - 25%

(3) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාලව ජල සහ විදුලි බිල්පත්වල පහත සඳහන් ගනුදෙනු ගිණුම් පොත්වල සටහන්ව නොමැත.

- මාර්තු මාසය සඳහා උපචිත ජල බිල්පතෙහි වටිනාකම රු. 12,000
- වැඩිපුර ගෙවන ලද විදුලි බිල රු. 63,000

(4) 2018 අප්‍රේල් 01 දින රු. 350,000 ක මුදලක් වාර්ෂිකව 10% ක පොලී අනුපාතයක් මත ස්ථාවර තැන්පතුවක ආයෝජනය කරන ලදි. වර්ෂයට අදාල පොලිය 2019 අප්‍රේල් 01 දින ලැබිණ.

(5) 2018 අප්‍රේල් 01 දින ප්‍රදර්ශනාගාරය සඳහා වර්ෂයකට කුලී ගිවිසුමකට ඇතුලත් වූ අතර මාසික කුලිය රු. 75,000 කි.

(6) වෙළඳ ලැබිය යුතු මුදලින් රු. 20,000 ක් බොල් ණය ලෙස කපා හැරීමටත්, 2019 මාර්තු 31 දිනට ඉතිරි වෙළඳ ලැබිය යුතු මුදලින් 10% අඩමාන ණය ලෙස වෙන්කිරීමක් සිදු කිරීමටත් කළමණාකාරීත්වය තීරණය කරන ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ :**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**.

(a) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය. ***(ලකුණු 11)***

(b) 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. ***(ලකුණු 09)***

***(මුළු ලකුණු 20)***

**C කොටසෙහි අවසානය**

# කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| | | | |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න |
| | | වෙනස් කොට දක්වන්න | යමක් තවෙකකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම |
| | | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම |
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිතකර ගැළපීම | භාවිත කරන්න | ප්‍රායෝගිකව භාවිතයේ යෙදෙන්න |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම |
| | | පිළියෙළ කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම |
| | | විසඳන්න | ගණනය කිරීම හා හෝ පැහැදිලි කිරීම හරහා විසඳුම් සෙවීම |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මකබව තීරණය කරන්න |
| | | ප්‍රස්ථාර දක්වන්න | ප්‍රස්ථාර මගින් නියෝජනය කරන්න |
| | | සසඳන්න | තවත් එකක් සමග අනුගත/අනුරූප කරන්න |
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න |
| | | අර්ථකථනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න |
| | | හඳුනා ගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම |
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම |
| | | අඳින්න | හැඩයක් හෝ රූප සටහනක් ගෙනහැර දැක්වීම |
| **නිපුණතා මට්ටම** | **විස්තරය** | **ක්‍රියා ලැයිස්තුව** | **ක්‍රියා නිර්වචනය** |

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2020 විෂය නිර්දේශය

## ආදර්ශ විසඳුම්

# අදියර I

# 101 - මූල්‍ය ගිණුම්කරණය [FAC]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි

| | | |
|---|---|---|
| | **වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**<br>**අනිවාර්ය ප්‍රශ්න විස්ස(20) කි.** | **A කොටස** |

(මුළු ලකුණු 40)

**01 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

1.1 (2)
1.2 (1)
1.3 (3)
1.4 (3)
1.5 (1)
1.6 (2)
1.7 (1)
1.8 (2)
1.9 (4)
1.10 (3)
1.11 සත්‍යයි
1.12 අසත්‍යයි
1.13 සත්‍යයි
1.14 අසත්‍යයි
1.15 සත්‍යයි

1.16
- වේගවත් බව
- වාර්තාවල විශ්වාසනීයත්වය ඉතා ඉහළ වීම
- ලබාදෙන තොරතුරුවල නිරවද්‍යතාව ඉහළ වීම
- අනවශ්‍ය සේවකයින් අඩු කල හැකි වීම
- තොරතුරු විශ්ලේෂණය කිරීමේ හැකියාව ඉහළ වීම
- තොරතුරු ගබඩා කිරීමේ ධාරිතාව ඉතා ඉහළ වීම
- ආයතනයට යාවත්කාලීන වාර්තාවන් ලබාගත හැකි වීම

1.17
a) බැර පත
b) ජ'ර්නල් වවුචරය

1.18 අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ආර්ථික සම්පත් හුවමාරු කිරිමට, වර්තමාන බැඳීමක් වගකීමක් වේ.

1.19 මුදල් පොතේ ශේෂය සහ බැංකු ප්‍රකාශනයේ ශේෂය අතර පවතින වෙනසට හේතු හඳුනා ගැනීම වේ.

1.20

ණයගැති පාලන ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | *986,600* | බොල් ණය | *30,000* |
| විකුණුම් | *1,569,700* | මුදල් | *1,200,000* |
| | | ආපසු එවුම් | *32,500* |
| | | ශේෂය ප/ගෙ | *1,293,800* |
| | *2,556,300* | | *2,556,300* |

***(එකකට දෙක බැගින් මුළු ලකුණු 40 යි.)***

**අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.**

(මුළු ලකුණු 40)

**B කොටස**

**02 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

**(a)**

**KPM ට්‍රේඩර්ස්**
**පොදු ජ'ර්නලය**

| | විස්තරය | හර (රු.) | බැර (රු.) |
|---|---|---|---|
| (1) | ගැනුම් ගිණුම<br>කාර්යාල ලී බඩු ගිණුම<br>(ගිණුම් අතර වර්ගීකරණයේදී සිදු වූ වරද නිවැරදි කිරීම) | 81,000 | 81,000 |
| (2) | ණයගැති පාලන ගිණුම<br>විකුණුම් ගිණුම<br>(මාසයට අදාල විකුණුම් නිවැරදි කිරීම) | 75,000 | 75,000 |
| (3) | අවිනිශ්චිත ගිණුම<br>පොළී ආදායම් ගිණුම<br>(පොළී ආදායම අඩුවෙන් සටහන් වීමේ වරද නිවැරදි කිරීම) | 71,100 | 71,100 |
| (4) | අවිනිශ්චිත ගිණුම<br>දුරකතන වියදම් ගිණුම<br>(දුරකතන වියදම් දෙවරක් සටහන් වීමේ වරද නිවැරදි කිරීම) | 48,000 | 48,000 |
| (5) | මෝටර් රථ ගිණුම<br>අවිනිශ්චිත ගිණුම<br>( මෝටර් රථ ගිණුමට පිටපත් කිරීමේදී සිදු වූ වරද නිවැරදි කිරීම) | 81,000 | 81,000 |
| (6) | ක්‍ෂය ගිණුම<br>සමුච්චිත ක්‍ෂය ගිණුම<br>(මෝටර් සයිකලයට අදාලව ක්‍ෂය අඩුවෙන් ගණනය කිරීමේ වරද නිවැරදි කිරීම) | 4,860 | 4,860 |

*(ලකුණු 06)*

**(b)**

| **අවිනිශ්චිත ගිණුම** | | | |
|---|---|---|---|
| | | ශේෂය ඉ/ගෙ | **38,100** |
| පොළී ආදායම් | 71,100 | මෝටර් වාහන | 81,000 |
| දුරකථන වියදම් | 48,000 | | |
| | 119,100 | | 119,100 |

*(ලකුණු 02)*

**(c)**

| | | |
|---|---|---|
| කෙටුම්පත් ගිණුම් ප්‍රකාශන අනුව ලාභය | | 1,725,000 |
| **එකතු කිරීම්** | | |
| පොළී ආදායම | 71,100 | |
| විකුණුම් | 75,000 | |
| දුරකථන | 48,000 | 194,100 |
| | | 1,919,100 |
| **අඩු කිරීම්** | | |
| මිලදී ගැනීම් | 81,000 | |
| ක්ෂය වීම් | 4,860 | (85,860) |
| ගලපන ලද ලාභය | | 1,833,240 |

*(ලකුණු 02)*
*(මුළු ලකුණු 10)*

**03 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

**කරුණාතිලක මහතාගේ ව්‍යාපාරය**
**2019 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම**

| | රු. | රු. |
|---|---|---|
| බැංකු මුදල් (3,525,000 - 3,304,500) | 220,500 | |
| විකුණුම් (1,300 + 1,646 + 142) (පෙර වැඩ-03) | | 3,088,000 |
| ගැනුම් (පෙර වැඩ-02) | 1,610,000 | |
| වැටුප් හා වේතන | 1,540,000 | |
| විදුලි බිල්පත | 163,000 | |
| කාර්යාල උපකරණ | 240,000 | |
| ජල බිල්පත (28,000 + 5,500) | 33,500 | |
| ප්‍රාග්ධනය | | 1,250,000 |
| ගෙවිය යුතු ජල බිල්පත | | 5,500 |
| වෙළඳ ණයහිමියන් | | 320,000 |
| වෙළඳ ණයගැතියන් | 671,000 | |
| ක්ෂය - කාර්යාල උපකරණ | 60,000 | |
| සමුච්චිත ක්ෂය - කාර්යාල උපකරණ | | 60,000 |
| ලිපි ද්‍රව්‍ය | 7,200 | |
| ගමන් වියදම් | 9,800 | |
| සුළු මුදල් ශේෂය | 13,000 | |
| දුරකථන වියදම් | 42,000 | |
| ගැනිලි | 75,000 | |
| ප්‍රචාරණය | 25,000 | |
| බැංකු ගාස්තු | 13,500 | |
| | 4,723,500 | 4,723,500 |

*(ලකුණු 10)*

## පෙර වැඩ

පෙර වැඩ - 01

ක්ෂය - කාර්යාල උපකරණ

රු. 240,000 ට 25% බැගින් - 60,000

**පෙර වැඩ - 02**

**වෙළඳ ණයහිමි**

| | | | |
|---|---|---|---|
| මුදල් | 1,290,000 | ගැනුම් | 1,610,000 |
| ශේෂය ප/ගෙ | 320,000 | | |
| | 1,610,000 | | 1,610,000 |

**පෙර වැඩ - 03**

**වෙළඳ ණයගැති**

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 1,646,000 | මුදල් | 975,000 |
| | | ශේෂය ප/ගෙ | 671,000 |
| | 1,646,000 | | 1,646,000 |

**04 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

(a)

**ජනසෙත සහ පුත්‍රයෝ**
**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ගිණුම**

| | රු. | රු. |
|---|---|---|
| ආරම්භක තොගය - අමුද්‍රව්‍ය | | 1,700,000 |
| එකතු කිරීම් : අමුද්‍රව්‍ය ගැනුම් | 2,100,000 | |
| ගෙන ඒමේ කුලී - අමුද්‍රව්‍ය | 228,000 | 2,328,000 |
| | | |
| අඩු කළා : අවසාන අමුද්‍රව්‍ය තොගය | | (1,900,000) |
| පරිභෝජනය කළ අමුද්‍රව්‍යවල පිරිවැය | | 2,128,000 |
| | | |
| **අනෙකුත් සෘජු පිරිවැය** - සෘජු වේතන | 1,123,000 | |
| - දිරි දීමනා | 100,000 | 1,223,000 |
| | | 3,351,000 |
| එකතු කිරීම් : නොනිමි තොග (01.01.2019) | | 960,000 |
| අඩු කිරීම් : නොනිමි තොග (31.12.2019) | | (1,356,000) |
| **ප්‍රාථමික පිරිවැය** | | **2,955,000** |
| | | |
| නිෂ්පාදන පොදු කාර්යය | | |
| ක්ෂය - ගොඩනැගිල්ල (892,000 × 10%× 70%) | 62,440 | |
| ක්ෂය - යන්ත්‍ර (1,280,000 × 20%) | 256,000 | |
| වැටුප් - කම්හල් කළමණාකරු | 928,000 | |
| කම්හල් යන්ත්‍ර නඩත්තු වියදම් | 426,000 | |
| විදුලිය (රු.632,000 × 90%) | 568,800 | |
| කම්හල් ආරක්ෂක වියදම් | 115,000 | |
| ජලය (රු.522,000 × 80%) | 417,600 | |
| මුළු කම්හල් පොදු කාර්යය | | 2,773,840 |
| **දරන ලද නිෂ්පාදන පිරිවැය** | | **5,728,840** |
| ලාභ ආන්තිකය 15% | | 859,326 |
| **වෙළෙඳ අංශයට මාරු කළ භාණ්ඩවල වටිනාකම** | | **6,588,166** |

*(ලකුණු 08)*

(b)

එක් පෙට්ටියක නිෂ්පාදන පිරිවැය $= \dfrac{5,728,840}{20,000}$

= <u>රු. 286.44</u>

*(ලකුණු 02)*
*(මුළු ලකුණු 10)*

**05 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

(A)

(a)

ගලපන ලද මුදල් පොත

| | | | |
|---|---|---|---|
| පොළී ආදායම් | 3,500 | ශේෂය ඉ/ගෙ | 45,000 |
| ශේෂය ප/ගෙ | 50,800 | රක්ෂණ ගෙවීම | 4,800 |
| | | බැංකු ගාස්තු | 4,500 |
| | 54,300 | | 54,300 |

*(ලකුණු 03)*

(b)

| | |
|---|---|
| ගලපන ලද මුදල් පොතේ ශේෂය | (50,800) |
| අඩු කිරීම් : උපලබ්ධි නොවූ තැන්පත් | (50,000) |
| | (100,800) |
| එකතු කිරීම් : ඉදිරිපත් නොකළ චෙක්පත් | 25,000 |
| බැංකු ප්‍රකාශය අනුව ශේෂය | (75,800) |

*(ලකුණු 02)*

(B)

1) රු. 450,000 ක් වටිනා භාණ්ඩ ණයට ගැනීම

2) පිරිවැය රු.400,000 ක් වූ භාණ්ඩ රු. 500,000 කට විකුණා එයින් රු.75,000 ක මුදලක් එකතු කර ගැනීම.

3) ණයහිමියකුට කළ ගෙවීම රු.20,000.

4) රු.200,000 ක් වටිනා කාර්යාල උපකරණ මිලට ගෙන රු.50,000 ක් මුදලින් ගෙවීම.

5) අයිතිකරු විසින් රු.50,000 ක් වටිනා භාණ්ඩ ඔහුගේ පෞද්ගලික පරිහරණය සඳහා ලබා ගැනීම.

*(ලකුණු 05)*
*(මුළු ලකුණු 10)*

**අනිවාර්ය ප්‍රශ්න එක (01) කි.**

(මුළු ලකුණු 20)

**C කොටස**

**06 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

(a)

**ගයාන් ට්‍රේඩර්ස්**
**2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**විස්තීරණ ආදායම් ප්‍රකාශනය** (රු.'000)

| | | | |
|---|---|---|---|
| **විකුණුම්** | | | 17,390 |
| අඩුකලා : | | | |
| **විකුණුම් පිරිවැය** | | | |
| ආරම්භක තොග | | 875 | |
| ගැනුම් | | 12,200 | |
| අවසන් තොගය | | (1,600) | (11,475) |
| **දළ ලාභය** | | | 5,915 |
| **වෙනත් ආදායම්** | | | |
| ස්ථාවර තැන්පත් පොළී ආදායම (350 × 10%) | | | 35 |
| | | | 5,950 |
| **අඩුකලා :** | | | |
| **බෙදා හැරීමේ වියදම්** | | | |
| කොමිස් ගෙවීම් | 320 | | |
| මෝටර් රථ ක්ෂය (1900 × 15%) | 285 | | |
| අඩමාන ණය සඳහා වෙන් කිරීම් [සටහන් 02] | 43 | | |
| බොල් ණය | 20 | 668 | |
| **පරිපාලන වියදම්** | | | |
| වැටුප් හා වේතන | 990 | | |
| කුලී වියදම් (650+250)[සටහන් – 03] | 900 | | |
| විදුලිය (525-63) | 462 | | |
| ක්ෂය (සටහන් - 01) | 338 | | |
| ජලය (110+12) | 122 | 2,812 | (3,480) |
| **ශුද්ධ ලාභය / (අලාභය)** | | | 2,470 |

*(ලකුණු 11)*

| | | | |
|---|---|---|---|
| සටහන් - 01 | | | |
| **ක්ෂය ගණනය කිරීම** | | | |
| කාර්යාල උපකරණ | 540 × 20% | | 108 |
| ලී බඩු සවි කිරීම් | 1,840 × 25% × 6/12 | = | 230 |
| (2018 සැප්තැම්බර් 30 දින මිලට ගත්) | | | 338 |

| සටහන් - 02 | | |
|---|---|---|
| **අඩමාන ණය සඳහා පොදු වෙන්කිරීම (1,250 - 20)** | 1,230 ×10% | 123 |
| අඩමාන ණය වෙන්කිරීමේ ගිණුම් ශේෂය | | (80) |
| ඌන වෙන්කිරීම් | | 43 |

| සටහන් - 03 | | |
|---|---|---|
| **කුලී වියදම්** | | |
| මුළු කුලී වියදම | 75 ×12 | 900 |
| අඩුකලා : ගෙවන ලද කුලිය | | (650) |
| ගෙවිය යුතු කුලිය | | 250 |

(b)

**ගයාන් ට්‍රේඩර්ස්**
**2019 මාර්තු 31 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය** (රු.'000)

| | **පිරිවැය** | **සමුච්චිත ක්ෂය** | **ධාරන අගය** |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| මෝටර් ලොරි රථය | 1,900 | 625 | 1,275 |
| ලී බඩු සහ සවි කිරීම් | 1,840 | 230 | 1,610 |
| කාර්යාල උපකරණ | 540 | 268 | 272 |
| | 4,280 | 1,123 | 3,157 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | | 1,600 | |
| වෙළඳ ලැබිය යුතු මුදල් (1,250 - 20) | 1,230 | | |
| **අඩුකලා :** අඩමාන ණය සඳහා වෙන් කිරීම් (80+43) | (123) | 1,107 | |
| කලින් ගෙවූ විදුලිය | | 63 | |
| ලැබිය යුතු පොළිය | | 35 | |
| ස්ථාවර තැන්පතුව | | 350 | |
| බැංකු ශේෂය | | 90 | 3,245 |
| **මුළු වත්කම්** | | | **6,402** |
| **ස්කන්ධය** | | | |
| ප්‍රාග්ධනය | | 2,985 | |
| ශුද්ධ ලාභය | | 2,470 | |
| අඩුකලා : ගැනිලි | | (415) | 5,040 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ ගෙවිය යුතු මුදල් | | 1,100 | |
| ගෙවිය යුතු ජල බිල්පත | | 12 | |
| ගෙවිය යුතු කුලිය | | 250 | 1,362 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | | **6,402** |

*(ලකුණු 09)*
*(මුළු ලකුණු 20)*